



# නිවේදනයයි

## 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත

ඉහත පනත යටතේ මෙම ආයතනයට අදාළ තොරතුරු ලබා ගැනීම සඳහා පහත සඳහන් තොරතුරු නිලධාරීන් වෙත RTI 01 දරණ අයදුම්පත්‍රය මඟින් අයදුම්කළ හැකිය. මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීම අනිවාර්ය නොවේ.

**තොරතුරු නිලධාරී,**

- බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා මයා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)

  ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්.දහනායක මාවත,ගාල්ල

  දුරකථන අංකය -091 2222604/ 071 4178393

  විද්‍යුත් තැපැල -bimal_silva@yahoo.com

- ගාමිණී වීරවික්‍රම මයා- නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)

  ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්.දහනායක මාවත,ගාල්ල

  දුරකථන අංකය - 091 2231246/ 071 8675957

  විද්‍යුත් තැපැල -gaminiweerawickrama@yahoo.com

- සුනිල් පෝද්දිවල මයා- නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්)

  ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්.දහනායක මාවත,ගාල්ල

  දුරකථන අංකය - 091 2222421/ 077 7596240

  විද්‍යුත් තැපැල -poddiwalasunil@gmail.com

• ජී.වික්‍රමසිංහ මයා -අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්.දහනායක මාවත,ගාල්ල
දුරකථන අංකය - 091 2222418/ 077 3220240
විද්‍යුත් තැපැල - gwickrama25@yahoo.com

---

01. තොරතුරු ලබා ගැනීමට ලිඛිත RTI 01 අයදුම්පත්‍රය හෝ ලිපියක් හෝ වාචික ඉල්ලීමක් තොරතුරු නිලධාරියා වෙත ඉදිරිපත් කර එය ලැබුණු බවට ලිපියක් ලබා ගන්න.

02. ඔබේ ඉල්ලීමට අදළ තොරතුරු සැපයිය හැකිද යන්න පිලිබඳව හැකි ඉක්මනින්, කෙසේ වුවද දින 14 ක් තුළ දන්වනු ලැබේ.

03. ඉල්ලා සිටින ලද තොරතුරු ඔබට දීමට තීරණය කළහොත් කොමිෂන් සභාව නියම කළ ගාස්තුවක් ගෙවිය යුතු නම් එය ඔබට දන්වා එවනු ඇත. තොරතුරු ලබා ගැනීමට ගෙවීමක් කළ යතු නම් ඒ අනුව ගාස්තු ගෙවීම මත හෝ ගාස්තු ගෙවිය යුතුනොවේ නම් ගාස්තු රහිතව ඔබට දින 14ක් තුළ තොරතුරු ලබා දෙනු ඇත.

04. ගාස්තු ගෙවීමෙන් පසු දින 14ක් තුළ තොරතුරු ලබා දීම අපහසු වේ නම් තොරතුරු නිලධාරියා විසින් එකී කාලය දීර්ඝ කිරීමට අවශ්‍ය හේතු සඳහන් කරමින් දින 21 කට නොවැඩි අතිරේක කාලයක් තුළ ඔබ ඉල්ලා සිටි තොරතුරු ඔබට ලබා දෙනු ඇත.

05. තොරතුරු ලබා ගැනීම සඳහා වන ඉල්ලීම යම් පුරවැසියකුගේ ජීවිතය සහ පුද්ගලික නිදහස සම්බන්ධයෙන් වන අවස්ථාවක ඉල්ලීම සඳහා ප්‍රතිචාර දැක්වීම ඉල්ලීම ලැබී පැය 48ක් තුළ සිදුකරනු ඇත.

06. තොරතුරු ලබා ගැනීම සඳහා කරන ලද ඉල්ලීමකට අදාළව,

I. තොරතුරු ඉල්ලීම සඳහා කරන ලද යම් ඉල්ලීමක් භාරගැනීම ප්‍රතික්ෂේප කිරීම -
II. පනතේ 5 වැනි වගන්තිය යටතේ ප්‍රදානය කිරීමෙන් මුක්ත කර ඇති තොරතුරු හේතුවෙන් යම් තොරතුරක් වෙත ප්‍රවේශ වීම සඳහා අවස්ථාව ලබා දීම ප්‍රතික්ෂේප කිරීම,
III. පනත මඟින් නිශ්චිතවම දක්වා ඇති කාලසීමාවන්ට අනුකූල නොවීම
IV. සම්පූර්ණ නොවූ , නොමග යවන හෝ සාවද්‍ය තොරතුරු ප්‍රදානය කිරීම,
V. වැඩිපුර ගාස්තු අයකිරීම,
VI. ඉල්ලා සිටිනු ලබන ආකෘතියෙන් තොරතුරු සැපයීමට තොරතුරු නිලධාරියා විසින් ප්‍රතික්ෂේප කිරීම,

VII. එම තොරතුරු වෙත එම පුරවැසියා ප්‍රවේශවීම වැළැක්වීම සඳහා එම තොරතුරු විකෘතිකර, විනාශකර හෝ අස්ථානගත කර ඇති බවට තොරතුරු ඉල්ලා සිටිනු ලබන පුරවැසියා හට සාධාරණ හේතු පැවතීම.

මත අතෘප්තියට පත්වන්නේ නම් පහත සඳහන් නම් කළ නිලධාරියා වෙත දින 14ක් තුළ අභියාචනයක් ඉදිරිපත් කරන්න.

**නම් කළ නිලධාරියා,**


ආර්.සී.ද සොයිසා මයා

ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්.දහනායක මාවත, ගාල්ල

දුරකථන අංකය - 091 2232343/ 071 8210474

විද්‍යුත් තැපැල - chiefsec1@sltnet.lk


07. මෙම නිවේදනයේ 6 වන වගන්තිය පරිදි අභියාචනයක් ඉදිරිපත් කිරීමේ දී පහත දැක්වෙන RTI 10 දරන අයදුම්පත පුරවා ඉදිරිපත් කරන්න. RTI 10 දරන අයදුම්පත පිරවීම අනිවාර්යය නොවේ. තොරතුරු ඉල්ලා සිටින්නාට RTI 10 අයදුම්පත්‍රයේ සඳහන් අභියාචනය විභාග කිරීමට අවශ්‍ය මූලික තොරතුරු සඳහන් කරමින් ලිපියක් මඟින් අභියාචනය ඉදිරිපත් කළ හැකිය.